## සමාව අයැදීම

2016 ජනවාරි මස "සන්නස" මුද්‍රිත හා අන්තර් ජාල කලාපවල අපි ඩී. බී. කුරුප්පු මහතා විසින් ලියන ලද "ප්‍රශස්ති ප්‍රතිපත්ති නොහොත් යාරා ගඟේ ගිලෙන්නට ගිය ලේඛකයා" නම් වූ ලිපිය පළ කළෙමු. එම ලිපිය මගින් තමන්ට අපහාසයක් වී ඇතැයි ටියුඩර් අමරසේන මහතා අප වෙත දන්වා එවා ඇත.

එම ලිපියේ අඩංගු කිසිදු විවේචනයක් සන්නස පුවත්පත විසින් අනුමත නොකරනු ලබන අතර එම ලිපිය සම්පූර්ණයෙන්ම ඉවත් කොට ගැනීමට අපි අපේ කැමැත්ත ප්‍රකාශ කොට සිටිමු. සන්නස පුවත්පතේ පළ වන ලිපි වන අන්තර්ගතය පිළිබඳ වගකීම අදාල ලේඛකයන් සතු වුවත් එම ලිපියෙන් අමරසේන මහතාට යම් සිත් තැවුලක් වේදනාවක් හෝ අපහාසයක් හෝ ඇති වූවා නම් සන්නස පුවත්පත අමරසේන මහතාගෙන් කොන්දේසි විරහිත ලෙස සමාව අයැද සිටියි.

සංස්කාරකවරු



## "මතක සෙවණැලි" තුළින් මතුවන
# අතීතය සහ අනාගතය

මුරුගපූපන්ගේ පොත ගැන මා ජගත්ගෙන් ඇසුවේ මගේ පිටපත අත දිග හරියක නොතිබුණු නිසා ය. පසුව සොයාගත් මම නැවත කියවීමට පටන් ගතිමි. මේ ලිපිය ඒ කියවීමේ ප්‍රතිඵලයකි.

මෙවර මගේ අවධානයට ලක්වූයේ පොතට අයත් කවි කතා නොව පෙරවදනය. පූපති නම් වූ පුද්ගලයා සහ ඔහු විසින් ජාතික සමගිය වෙනුවෙන් ඉටු කරන ලද මෙහෙවර ද අනාවරණය වන්නේ ඒ පෙරවදනේ ය.

මීගමුවේ උපත ලබා යාපනයේ සහ මීගමුවේ ඉගෙනීම ලැබූ පූපති සිංහල ඉගෙනීමට පටන් ගත්තේ වයස දහයේදී ය. ඒ සඳහාම මව් පියන් විසින් සොයා ගන්නා ලද ගුරුවරයකුගෙන්ය. තමාට සිංහල ඉගැන්වීම ගැන මවගෙන් ප්‍රශ්න කළ ළමා පූපතිට මව දුන් පිළිතුර එදාට වඩා අදට වටිනවාය.

"දෙමළ ඔබේ මව් බස වුණත් සිංහල බස වන සහෝදර බසත් ඉංගිරිසි නම් අන්තර්ජාතික බසත් දැනගත යුතුයි. එය ඔබටත් ඔබේ අයටත් ප්‍රයෙ-ා්ජනවත් වෙනවා"

ඒ 1961 දී ය. 1970 වන විට මුරුගපූපති සිංහල සාහිත්‍ය පොත පත දෙමළෙන් කියවීමට පටන් ගත්තේය. එදා සිටි බොහෝ ලේඛකයන්ගේ කෙටිකතා ආදිය දෙමළ බසින් කියවීමට ඔහු සමත් වීම පවා බොහෝ දෙනකුට පුදුමයට කරුණක් වනු නිසැකය. එබඳු අවසරයක් සිංහල කියවූ අපට ලැබුණේ නැත. එහෙම දෙයක් කළේ හීන්පැල්ලේ ධර්මරතන හිමියන් පමණි. මා දැන සිටි විශ්වනාත් වජිරසේන පවා එබඳු වැඩකට අත ගැසුවේ නැත. මා ලියූ "පිරිමි ජාතිය උතුම් ජාතිය" නම් ලිපි එකතුවේ අගටම එන ලිපියෙන් මම සිංහල දෙමළ දෙබස අතර ඇති සමානතා පෙන්වා දීමට තැත් කළත් 1961 දී පූපතිට ඉගැන්වූ ධර්මසේ න නම් සිංහලයා ඒ කාරියට යොමු වූයේ මට වඩා වසර 40 කට කලින් ය.

"මගේ ගුරුවරයා සිංහල හා දෙමළ අකුරු අතර ඇති සමාන හැඩ මතුකර දක්වමින් ...... දෙමළ භාෂාවට ඉතා කිට්ටු සම්බන්ධතාවක් ඇති භාෂාව සිංහල බව මට පහදා දුන්නේ ය."

1958 දී ශ්‍රී අකුර වාහන වලට යෙදීමෙන් ජාතියටම හානියක් කළ උලත්තු මේ සුළු කරුණ නොදත්හ.

අප (යටත් පිරිසෙයින් මා) නොදත් කරුණක්ද පූපති සිය පෙර-වදනිනි හෙළි කරයි. ඒ " මල්ලිකයි" නමින් පළ කරන ලද දෙමළ සඟරාවේ සිංහල නිර්මාණ දෙමළ බසින් පළකිරීමට පුරුදුව සිටි බව ය. ඒ විදියේ හපන්කමක් කළ සිංහල සඟරාවක් මට මතක නැත .

පූපති සිය කෙටි කතා පොත පිදුවේ සුලටමළු න කා-යාරූපයේ දැක්වෙන සිංහලයකුටය. සිංහල භික්ෂුන් වහන්සේටය. කොරොස්නේ පණ්ඩිත රත්නවංශ හිමිපාණන-"ටය. එයට හේතුවක් ඇත . ඒ හේතුව ඔහු පැහැදිළි කර ඇත්තේ අගට ලියන "අමතක වූ කතාවක්" සටහනේ ය.

**"ජාතියක් හෝ භාෂාවක් යටත් කිරීමෙන් තවත් ජාතියක් සෞභාග්‍යයට පත් විය නොහැකිය. දෙමළ ජනතාවගේ මූලික ප්‍රශ්න වලට ප්‍රජාතාන්ත්‍රික පදනමින් විසඳුම් සෙවිය යුතුය. ශ්‍රී ලංකාවේ ජාතික සමගිය ඇති කළ හැක්කේ එවිටය. දෙමළ තරුණියක් සිංහල තරුණයකු සරණ පාවා ගැනීමෙන් හෝ සිංහල තරුණියක දෙමළ තරුණයකු සරණ පාවා ගැනීමෙන් ඉප-දෙන්නේ ජාතික සමගිය නොව ළමයින් ය"**

මේ යට කී කොරොස්සේ රත්නවංශ හිමියන්ගේ වචන ය. ප්‍රකාශ කරන ලද්දේ 1975 දී බණ්ඩා රනායක සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වන ලද සමුළුවක දී ය. ජාතික සමගිය පිළිබඳ සමුළුවක්. එහි ආරම්භක දේශනය කරමින් කොරොස්සේ රත්නවංශ හිමියන් කළ ඒ ඓතිහාසික ප්‍රකාශය මා දැන සිටියේ නැත . වීරකේසරී පුවත්පතේ කතුවැකියට යැවුණු ඒ සමුළුව හෝ දේශනය ගැන ලියූ සිංහල පුවත්පතක් තිබුණු බවක් මට මතක නැත .

එස් සිවකුමාරන් විසින් සිංහලට පරිවර්තනය කරන ලද දෙමළ කෙටිකතා පොතක් මට ලැබුණේ වසර හත අටකට ඉහත දී ය.

මට පූපතිගේ පොත "මතක සෙවණැලි" මිලට ගත්තේ 2014 අග හරියේ පැවැත්වු2ණු නොයෙල් නඩේසන් ගේ "සමණළ වැව" පොත එළි දැක්වූ අවස්ථාවේදී ය. කතා කළ අය අතරින් මට මතක හැටියට සිංහලෙන් කතා කළ දෙ-දෙනෙක් සිටියහ. ජගත් ජේ එදිරිසිංහ එක් කෙනෙකි. ප්‍රධාන කථිකයන් අතර සිංහලෙන් කතා කළ එකම පුද්ගලයා පූපති ය. මා පවා කතා කළේ ඉංගිරිසියෙනි.




අත්තනගල්ලේ පන්සලක වැඩ වසමින් සිංහල දෙමළ සමගිය උදෙසා නිහඬ සේවයක් ඉටු කළරත්නවංශ හිමියන් ගැන හොරගොල්ල වලව්වේ සිටි නායිකාව පවා දැන සිටි බවක් නොපෙනෙයි. දැන සිටියා නම් අද පවත්නා තත්වය මගහරවා ගැනීමට සුළු ඉඩක් ලැබෙන්නටත් තිබිණි.




අවි බලයෙන් දෙමළ ත්‍රස්තවාදීන් පරාජය කළ සිංහලයන් ජාතික සමගිය වෙනුවෙන් දරන තැත කෙතරම් දුබල වූවක්ද යන්න ඉහත දැක් වූ කරුණු ඔස්සේ අනාවරණය වනු නිසැක ය. ඒ බව අවබෙ-ා්ධ කර ගැනීමට පූපතිගේ පොතේ එන මුල් කතාව "සහකම්පනය" කියවීම ප්‍රමාණවත් ය.

ජාතික සමගිය හා සංහිඳියාව ගැන දේශනා කරන සිංහලයන් ඒ අතින් තව බොහෝ දුර යා යුතු බව පෙනී යන යථාර්ථයයි.

**කුසළ මහිම ජ්‍යොතිර්විද්‍යා පර්යේෂණායතනය**

196/4A ගාලුපාර පානදුර ශ්‍රී ලංකා

**හෙට්ටිආරච්චිගේ උපාලි පීරිස්**

ජ්‍යොතිශ විශාරද, ජ්‍යොතිෂ නන්දන, ජ්‍යොතිර්විද්‍යාරත්න,
කලාභූෂණ, ජ්‍යොතිශ පිළිබඳ බාහිර කථිකාචාර්ය, දේශීය වෛද්‍යක්‍රම පිළිබඳ ජාතික ආයතනය හා හොරණ ශ්‍රීපාලි විශ්වවිද්‍යාලය, දිවයිනටම සාම විනිසුරු

භාව කේන්ද්‍ර සෑදීම
විදේශ කේන්ද්‍ර සෑදීම
සියලුම නැකැත් (දේශීය විදේශීය) සෑදීම
පලාපල - මංගල නැකැත් සෑදීම
වාස්තුවිද්‍යානුකූලව නිවාස සැළසුම් පරීක්ෂා කිරීම

**දුරකතනය 03 8223 9307 / 0726 844 912**
ඊමේල් peirishu@yahoo.com